# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පුරප්පාඩු

## පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අභ්‍යන්තර විගණක - පුරප්පාඩු 01

- **සුදුසුකම්:**

**✱ බාහිර**

වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් (CIMA) හෝ සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් හෝ වසර හතරක කළමනාකරණය හෝ වාණිජවේදී ගෞරව උපාධිය

සහ

පළපුරුද්ද : රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක විගණනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් පළපුරුද්ද

**✱ අභ්‍යන්තර**

කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 අදාළ ක්ෂේත්‍රයේ සතුටුදායක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| * සටහන | : | පරිගණක ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. |
| * වයස | : | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර, වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත. |
| * සේවා කාණ්ඩය | : | මධ්‍යම කළමනාකරණ සේවය (MM 1-2) |
| * වැටුප් පරිමාණය | : | රු. 94,170 - 10X2,480 - 15X3,450 - 170,720 |
| * ආරම්භක වැටුප් තලය | : | රු. 94,170.00 |

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 83,803.00කි.

**<u>පොදු කොන්දේසි</u>**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.11.16 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල, 61150 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාදවී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන **www.cri.gov.lk** හි ද පළ කර ඇත.

**සභාපති,**

**පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල.**